# 14 මකුළු දැල

ඉස්සර කාලේ එක රටක රජකෙනකුට තමන්ගේ රට බේරා ගන්න සතුරු රජකෙනකු සමග යුද්ධ කරන්න සිද්ධ වුණා. ඒ වුණත් රජු යුද්ධයෙන් පැරදුණා. ඒ ගැන දුකෙන් රජතුමා මාලිගාවෙන් ගිහින් ගල් ගුහාවක සැඟවුණා.

ඉතින් දැන් රජතුමා දුකෙන් කල්පනා කර කර ඉන්නවා. රජතුමා දැක්කා තමන්ගේ අභිමුඛයෙහි මකුළුවෙක් දැලක් වියන්න උත්සාහ ගන්නවා. මකුළුවා කිහිප වරක් ම දැල වියන්න හැදුවත් සුළං පහරට ඒක කැඩිලා යනවා. ඒත් මකුළුවා උත්සාහය අත හැරියේ නැහැ. අන්තිමට මකුළුවා හොඳ දැලක් වියාගෙන සාර්ථක ප්‍රතිඵල ලබා ගත්තා.



“මේ මකුළුවා කොපමණ බාධා ආවත් පැරදිලා පලා ගියේ නැහැ. අන්තිමට තමන්ගේ බලාපොරොත්තුව සාර්ථක කර ගත්තා. මමත් මෙහෙම ඉඳලා හරියන්නේ නෑ” රජතුමා හිතුවා.

ඉන් පස්සේ නැවත සේනාව සංවිධානය කරගෙන ගිහින් රට බේරා ගත්තා.

## පැහැදිලි කිරීම්

අභිමුඛයෙහි - ඉදිරියෙහි

## ක්‍රියාකාරකම : 1

පාඩම ශබ්ද නගා කියවන්න.

## ක්‍රියාකාරකම : 2

පහත වාක්‍යවල කළු කර ඇති වචන ගුරුවරයාගේ උදව් ඇතිව විධිමත් උච්චාරණයෙන් යුතු ව ශබ්ද නගා කියවන්න.

i. සතුරු රජකෙනෙකු සමග **යුද්ධ** කරන්න සිද්ධ වුණා.
ii. රජු **යුද්ධයෙන්** පැරදුණා.
iii. තමන්ගේ **අභිමුඛයෙහි** මකුළුවෙක් දැලක් වියන්න පටන් ගත්තා.
iv. හොඳ දැලක් වියාගෙන **සාර්ථක ප්‍රතිඵල** ලබා ගත්තා.
v. කොපමණ **බාධා** ආවත් තමන්ගේ උත්සාහය අතහැරියේ නෑ.
vi. තමන්ගේ බලාපොරොත්තුව **සාර්ථක** කර ගත්තා.
vii. සේනාව **සංවිධානය** කරගෙන ගිහින් රට බේරා ගත්තා.

පහත දැක්වෙන වචනවල තද කළු පැහැයෙන් යුත් අකුර කෙරෙහි අවධානය යොමු කරන්න.

යුද්**ධ** අභිමු**ඛ**යෙහි සාර්**ථ**ක

ප්‍රති**ඵ**ල

## ක්‍රියාකාරකම : 3

පහත දැක්වෙන වාක්‍යවල මහාප්‍රාණ අකුරු යෙදී ඇති වචන යටින් ඉරක් අඳින්න.

i. වැඩි අස්වැන්නක් ලබා ගැනීමට බද්ධ වී වගා කරනු ලැබේ.
ii. ළමයි විභාගයේ ප්‍රතිඵල ලැබෙන තුරු නොඉවසිල්ලෙන් පසුවෙති.
iii. තමා විසින් ලියන ලද පොත් ජනප්‍රිය වූ විට ලේඛකයා මහත් සතුටක් ලබයි.
v. ටජ්මහල ලෝක ප්‍රසිද්ධ අපූර්ව නිර්මාණයකි.
vi. ඇතැම් ආහාර වර්ගවල මිල අධික වුවත් පෝෂණ ගුණයෙන් අඩු ය.

vii. දේශනයක් සිත් ගැනීම සඳහා කථිකයාගේ වාග්මාලාව හා ඉරියව් උපකාරී වේ.

viii. නිවිති බනිජ අඩංගු ආහාරයකි.

ix. කඩල, මුං, කුරක්කන් හා කව්පි ධාන්‍ය වර්ගයට අයත් වේ.

x. පරාර්ථකාමී බව ඉතා අගනා ගුණාංගයකි.

xi. ධාරානිපාත වර්ෂාව නිසා ගංවතුර ගැලීම්, නාය යෑම් ආදිය ඇති වේ.

xii. ඉඩමක වර්ගඵලය සෙවීමට එහි දිග පළලින් වැඩි කළ යුතු ය.

## ක්‍රියාකාරකම : 4

කළු කර ඇති පද නිවැරදි ව උච්චාරණය කරමින් විරාම ලක්ෂණ කෙරේ සැලකිලිමත් වෙමින් මේ කතාව පන්තිය ඉදිරියේ කියවන්න.

ඉස්සර කාලේ **මඛාදේව** නමින් රජ කෙනෙක් හිටියා. මේ රජතුමා හරි ම **ධාර්මික** කෙනෙක්. " තමාගේ හිසේ **නරකෙසක්** දුටුවොත් වහා ම කියන්නැ" යි ඔහු රජගෙදර **කරණවෑමියාට** කියා තිබුණා. දවසක් කරණවෑමියා රජතුමාගේ හිසකේ කපන්න පටන් ගත්තා. රජතුමාගේ හිසේ නරකෙසක් තිබෙනු දුටු කරණවෑමියා " රජතුමනි, මෙන්න, ඔබතුමාගේ හිසේ නරකෙසක් තිබෙනවා" කියා නරකෙස ගළවා රජතුමාගේ අතට දුන්නා.

මේ **අවස්ථාවේ** රජතුමා මෙහෙම හිතුවා.

" දැන් මා තපසට යා යුතු කාලය ඇවිත්. මෙතෙක් කල් මම ඉතා යහපත් ලෙස රජකම් කළා. එහි **ප්‍රතිඵලයක්** ලෙස රටවැසියන් සතුටින් කල්ගත කරනවා."

වහා ම රාජසභාව කැඳවූ රජතුමා තමාගේ **පුත්‍රයාට** රජකම පවරා තපස් රැකීම සඳහා වනගත වුණා.

### පැහැදිලි කිරීම්

ධාර්මික - ගුණ යහපත් ( ධර්මයට අනුව ජීවත් වන )
නරකෙසක් - ඉදුණු කෙස් ගසක්
කරණවෑමියා - හිසකෙස් රැවුල් කපන තැනැත්තා
පුත්‍රයා - පුතා

## ක්‍රියාකාරකම : 5

ඔබ ගමන් බිමන් යන විට දී සහ විවිධ ස්ථානවල දී නොයෙක් නාම පුවරු දැක ඇත. එවැනි නාම පුවරු කිහිපයක් පහත දක්වේ. ඒවායේ කළු කර ඇති පද ලියා ඇති ආකාරයත් එදිනෙදා ව්‍යවහාරයේ දී ඒවා උච්චාරණය කරන ආකාරයත් හඳුනාගන්න.

- බස් **රථය** තුළ දුම්බීම තහනම්
- **ඉන්ධන** පිරවුම්හල
- **සුනඛයින්ගෙන්** ප්‍රවේසම් වන්න
- පදිකයින් මාරුවන **ස්ථානය** ඉදිරියෙන්
- පොලිස් මාර්ග **බාධකය**
- ලංකා කාර්මික **සංවර්ධන** මණ්ඩලය
- ලංකා බැංකුව දිවුලපිටිය **ශාඛාව**
- ඔබේ **ධාවන** තීරුව අනුගමනය කරන්න.
- **මාර්ගස්ථ** මගී ප්‍රවාහන **අධිකාරිය**
- දිසා **අධිකරණය**
- ජාතික **සෞඛ්‍ය** විද්‍යායතනය
- **ප්‍රතිඵල** ශාඛාව

මෙම නාම පුවරුවල ථ, ධ, ඛ, ඵ යන මහාප්‍රාණ අකුරු සහිත වචන ඇතුළත් වී ඇත.

## ක්‍රියාකාරකම : 6

- නාම පුවරුවල දක්නට ලැබෙන මහාප්‍රාණ අකුරු සහිත වචන ඇතුළත් වගන්ති එක් රැස් කර පන්තියට ඉදිරිපත් කරන්න.